**THE OPEN UNIVERSITY OF SRI LANKA**
**FACULTY OF HUMANITIES AND SOCIAL SCIENCES**
**DEPARTMENT OF LEGAL STUDIES**
**LLB DEGREE PROGRAMME- LEVEL 3**
**FINAL EXAMINATION -2021/2022**
**LLU3901/LWU1201- CONSTITUTIONAL LAW I**
**DURATION- 3 HOURS**

---

**DATE: 13 January 2023** **TIME: 9.30 a.m – 12.30 p.m**

---

Answer **any five (05)** questions only.

Candidates will be penalized for illegible handwriting.

1. Although parliament sovereignty is a strong and historical concept in the United Kingdom, its significance and relevance in Sri Lanka after the Second Republican Constitution is negligible. The parliament under the Second Republican Constitution, compared with the First Republican Constitution, is neither sovereign nor supreme legislatively.

   Analyse the above statement in light of the doctrine of sovereignty of parliament in the context of post-independence constitutions of Sri Lanka.

   Support your answer with relevant constitutional provisions and case law.

   **(20 marks)**

2. The legal concept of "Rule of Law" is the cornerstone to any democratic constitution in the world. The Diceyan formulation of the concept has been developed in significant ways through different contemporary interpretations and novel understandings of the legal concept.

   Discuss the validity of the above statement with reference to the 1978 Constitution of Sri Lanka.

   **(20 marks)**

00201

ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය

මානව ශාස්ත්‍ර හා සමාජයීය විද්‍යා පීඨය

නීති අධ්‍යයනාංශය

නීතිවේදී උපාධි පාඨමාලාව - 3 වන මට්ටම

අවසාන පරීක්ෂණය - 2021/22

**LLU3901/LWU1201- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතිය - I**

කාලය - පැය 3 යි.

---

දිනය: **2023** ජනවාරි **13** වේලාව: පෙ.ව **09.30** - ප. ව **12.30**

---

**<u>ඕනෑම ප්‍රශ්න පහකට (05)</u> පමණක් පිළිතුරු සපයන්න.**

**අපැහැදිලි අත් අකුරු සඳහා ලකුණු අඩු කරනු ලැබේ.**

**1.** පාර්ලිමේන්තු ස්වාධිපත්‍යය පිළිබඳ සංකල්පය එක්සත් රාජධානිය තුළ වඩාත් ශක්තිමත් සහ ඓතිහාසික සංකල්පයක් වුවද, දෙවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පසු ශ්‍රී ලංකාව තුළ එහි වැදගත්කම සහ අදාළත්වය සැලකිය යුතු මට්ටමක නොපවතින බව පෙනේ. දෙවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ වන පාර්ලිමේන්තුව, පළමු ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හා සසඳන විට, ව්‍යවස්ථාදායකය වශයෙන් ස්වෛරී හෝ උත්තරීතර ආයතනයක් නොවේ.

නිදහසින් පසු ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සන්දර්භය තුළ පාර්ලිමේන්තු ස්වාධිපත්‍යය පිළිබඳ මූලධර්මය ආශ්‍රයෙන් ඉහත ප්‍රකාශය විශ්ලේෂණය කරන්න.

අදාළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය ප්‍රතිපාදන සහ නඩු තීන්දු නීතිය ඇසුරෙන් ඔබේ පිළිතුර තහවුරු කරන්න.

**(ලකුණු 20)**

**2.** "නීතියේ ආධිපත්‍යය" යන නෛතික සංකල්පය ලෝකයේ ඕනෑම ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක මුරගල (මූලික පදනම) වේ. මෙම සංකල්පයට අදාළ ඩයිසිගේ ඉදිරිපත් කිරීම විවිධ සමකාලීන අර්ථකථන සහ නෛතික සංකල්පය පිළිබඳ වූ නව අවබෝධයන් හරහා සැලකිය යුතු ආකාරවලින් වර්ධනය වී ඇත."

ශ්‍රී ලංකාවේ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ඇසුරින් ඉහත ප්‍රකාශයේ වලංගුභාවය සාකච්ඡා කරන්න.

**(ලකුණු 20)**

3. Mr. Maxwell was newly elected as the executive President of the Democratic Socialist Republic of Marino. He recently announced that he has decided to grant a special presidential pardon to three prisoners sentenced to death by the Supreme Court of Marino. One of the prisoners has been identified as a very close relation of a minister who is also a member of the political party of which President Maxwell is the leader. The case which was on a gang rape made controversial news those days and the judiciary also had taken lots of efforts to identify the culprit. There were many criticisms levelled against president's action to grant pardon to these three prisoners. One of the main allegations highlighted in the criticisms was that the pardon motivated by partisan interests. In response to this, President Maxwell made press release stating that the pardon was based on the mere fact they repented their crimes. As per the statement of President, he followed the proper procedure recommended by the Constitution of Marino in granting pardon. However, it was revealed that the trial judge of these three prisoners' case has made a report against granting such pardon. Nevertheless, Mr. Kiyatho, the Minister of Justice of Marino stated that he recommended these three prisoners for presidential pardon considering both the trial judge's report and the advice of Marino's Attorney General.

A civil organization for human rights protection intended to file a case at the Supreme Court of Marino to challenge Maxwell's actions. Suppose that you have been consulted for your opinion by this civil organization.

Assuming that constitutional law of Democratic Socialist Republic of Marino is similar to that of Sri Lanka, provide your opinions on the following aspects. Refer to relevant constitutional provisions and case law where necessary.

a. Whether the President Maxwell could be sued against his action in granting pardon for three prisoners sentenced to death by the Supreme Court of Marino. Your answer should be based on prerogative power of the executive president, including granting of pardon and presidential immunity from legal actions.

**(14 marks)**

b. The members of the Parliament of Marino decide to remove President Maxwell from his position on the grounds of arbitrary ruling and violation of the Marino's Constitution. Explain the method to be followed by the Parliament of Marino in removing Maxwell from executive presidency.

**(06 marks)**

**3.** මැක්ස්වෙල් මහතා මැරිනෝ ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අලුතින් තේරී පත් වූ විධායක ජනාධිපතිවරයා වේ. මැරිනෝ ශ්‍රේෂ්ඨාධිකරණය විසින් මරණ දඬුවම නියම කරන ලද සිරකරුවන් තිදෙනෙකුට විශේෂ ජනාධිපති සමාවක් ලබාදීමට තමන් තීරණය කර ඇති බවට ඔහු පසුගියදා ප්‍රකාශයක් සිදු කරන ලදී. ඉන් එක් සිරකරුවෙකු ජනාධිපති මැක්ස්වෙල් නායකත්වය දරන දේශපාලන පක්ෂයේ සාමාජිකයෙකු වන අමාත්‍යවරයෙකුගේ ඉතා සමීප ඥාතියෙකු බව හඳුනාගෙන තිබේ. සමූහ ස්ත්‍රී දූෂණයක් හා සම්බන්ධ මෙම නඩුව ඒ දිනවල දැඩි ආන්දෝලනාත්මක පුවත් මැවූ අතර වරදකරු හඳුනා ගැනීම සඳහා අධිකරණය ද දැඩි පරිශ්‍රමයක් දරන ලදී. එබැවින් මෙම සිරකරුවන් තිදෙනාට ජනාධිපති සමාව ලබාදීමට ජනාධිපතිවරයා ගත් ක්‍රියාමාර්ගයට එරෙහිව බොහෝ විවේචන එල්ල විය. එකී විවේචන තුළ ඉස්මතු වූ ප්‍රධාන චෝදනාවක් වූයේ එම සමාව ප්‍රදානය කිරීම පක්ෂග්‍රාහී අවශ්‍යතා මත සිදු වූවක් බවයි. මෙයට ප්‍රතිචාර වශයෙන් ජනාධිපති මැක්ස්වෙල් මාධ්‍ය නිවේදනයක් නිකුත් කරමින් කියා සිටියේ ජනාධිපති සමාව ලබා දීම පදනම් වූයේ හුදු ඔවුන් වරද පිළිගෙන ඒ පිළිබඳව පසුතැවිලි වූ කාරණය බවයි. ජනාධිපතිවරයාගේ ප්‍රකාශයට අනුව, සමාව ලබා දීමේදී ඔහු මැරිනෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ නිර්දේශිත නිසි ක්‍රියා පටිපාටිය අනුගමනය කර තිබෙන බව පෙනේ. කෙසේ වෙතත්, අනාවරණය වී ඇති ආකාරයට මෙම සිරකරුවන් තිදෙනාට අදාළ නඩුවේ විනිසුරුවරයා විසින් එසේ සමාව දීමට එරෙහිව වාර්තාවක් ඉදිරිපත් කර ඇති බව පෙනේ. නඩු විභාගය පිළිබඳ විනිසුරුවරයාගේ වාර්තාව සහ මැරිනෝ හි නීතිපතිවරයාගේ උපදෙස් යන කාරණා ද්විත්වයම සලකා බලා මෙම සිරකරුවන් තිදෙනා ජනාධිපති සමාව සඳහා නිර්දේශ කළ බව මැරිනෝ හි අධිකරණ අමාත්‍ය කියාතෝ මහතා තවදුරටත් ප්‍රකාශ කර ඇත.

මානව හිමිකම් ආරක්ෂා කිරීම සඳහා වන සිවිල් සංවිධානයක් ජනාධිපති මැක්ස්වෙල්ගේ ක්‍රියාවන් අභියෝගයට ලක් කරමින් මැරිනෝ ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩුවක් ගොනු කිරීමට අදහස් කරයි. මෙම සිවිල් සංවිධානය විසින් ඒ පිළිබඳව ඔබගේ මතය විමසා ඇති බව උපකල්පනය කරන්න. මැරිනෝ ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතිය ශ්‍රී ලංකාවේ නීතියට සමාන යැයි උපකල්පනය කරමින් පහත අවස්ථා පිළිබඳව ඔබේ අදහස් දක්වන්න. අවශ්‍යය අවස්ථා වලදී අදාළ ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන සහ නඩු තීරණ වෙත අවධානය යොමු කරන්න.

**අ).** මැරිනෝ හි ශ්‍රේෂ්ඨාධිකරණය විසින් මරණ දණ්ඩනය නියම කරන ලද සිරකරුවන් තිදෙනෙකුට සමාව ලබා දෙමින් ජනාධිපති මැක්ස්වෙල් විසින් ගත් ක්‍රියාමාර්ගයට එරෙහිව ඔහුට විරුද්ධව නඩු පැවරිය හැකිද යන්න. ඔබගේ පිළිතුර සමාව දීම සහ නඩු කටයුතු වලින් විනිර්මුක්තිය ලැබීමද ඇතුළත් ව, විධායක ජනාධිපතිවරයාගේ පරමාධිකාරී බලය මත පදනම් විය යුතුය.

**(ලකුණු 14)**

4. The judiciary of a democratic state required to be independent from the other organs of the state as well as in its interpretation of laws. However, compared to the Soulbury Constitution, post-independence constitutions of Sri Lanka allow the Parliament and the executive to interfere with matters relating to the composition of the Judiciary and judicial actions in a manner that weakens the independence of judiciary.

Critically analyze the validity of the above statement drawing examples from relevant constitutional provisions and case laws.

**(20 marks)**

5. The doctrine of separation of powers has been developed on the basis that the division of the power among main institutions of the government will ensure that such power is exercised only for the benefit of society.

Critically evaluate the above statement with reference to the relevant constitutional provisions of Republican constitutions of Sri Lanka and case laws.

**(20 marks)**

6. Mr. Jayan is an academic in the Petunia State University and the president of the Professional Association of University Teachers (PAUT) in the State of Petunia. The PAUT and some other trade unions decided to conduct a protest march from one city to the capital of Petunia to demonstrate their opposition on the recently implemented revenue regulations which increase the income tax in high amount. They intended to march for two days and gather in a large ground at the Central Business District (CBD) of the Petunia's capital to conduct a peaceful protest. A day before the commencement of the protest march, the organizers of the protest, including Mr. Jayan were informed by the CBD's Urban Council that the executive board of the council had revoked the previously granted permission for the protestors to gathering at the said ground due to security reasons. However, Mr Jayan found that the same ground has subsequently been made available to the Petunia's governing party to hold a party propaganda meeting.

However, the march proceeded from a different venue to the capital and started conducting a peaceful protest holding plaques in front of the President's Secretarial office in the Petunia's capital city. The police ordered the protestors to stop the protest stating that it violates the prevailing COVID-19 health guideline issued by the Petunia's Ministry of Health. However, the protest was continued, and it turned into violent as the police

ආ). අත්තනෝමතික ලෙස රාජ්‍යය පාලනය කිරීම සහ මැරිනෝ හි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝණය කිරීම යන හේතුන් මත ජනාධිපති මැක්ස්වෙල් ඔහුගේ තනතුරෙන් ඉවත් කිරීමට මැරිනෝ පාර්ලිමේන්තුවේ සාමාජිකයින් තීරණය කර තිබේ. මැක්ස්වෙල් විධායක ජනාධිපති ධූරයෙන් ඉවත් කිරීමේදී මැරිනෝ පාර්ලිමේන්තුව විසින් අනුගමනය කළ යුතු ක්‍රියාපටිපාටිය පැහැදිලි කරන්න.

**(ලකුණු 06)**

4. "ඕනෑම ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයක අධිකරණ පද්ධතිය එම රාජ්‍යයේ අනෙකුත් ආයතනවලින් මෙන්ම නීති අර්ථකථනය කිරීමේ ක්‍රියාවලිය තුළ ද ස්වාධීන විය යුතුය. කෙසේ වෙතත්, සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හා සසඳන විට, ශ්‍රී ලංකාවේ නිදහසින් පසු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවන් මගින් අධිකරණයේ ස්වාධීනත්වය දුර්වල වන ආකාරයෙන් අධිකරණයේ සංයුතිය හා අධිකරණ ක්‍රියාමාර්ග සම්බන්ධ කරුණුවලට මැදිහත් වීමට පාර්ලිමේන්තුවට සහ විධායකයට ඉඩ ලබා ලබා දී තිබේ."

අදාළ ව්‍යවස්ථාමය ප්‍රතිපාදන සහ නඩු තීන්දු නීතිය මගින් උදාහරණ දක්වමින් ඉහත ප්‍රකාශයේ වලංගුභාවය විවේචනාත්මකව විශ්ලේෂණය කරන්න.

**(ලකුණු 20)**

5. ආණ්ඩුවේ ප්‍රධාන ආයතන අතර බලය බෙදී යාමෙන් එම බලය සමාජයේ යහපත සඳහා පමණක් ක්‍රියාත්මක වන බවට සහතික වනු ඇත යන පදනම මත බලතල බෙදීමේ සිද්ධාන්තය ගොඩ නැගී තිබේ.

ශ්‍රී ලංකාවේ ජනරජ ව්‍යවස්ථාවන්හි අදාළ ව්‍යවස්ථාමය ප්‍රතිපාදන සහ නඩු තීන්දු නීතිය දක්වමින් ඉහත ප්‍රකාශය විවේචනාත්මකව අගයන්න.

**(ලකුණු 20)**

6. ජයන් මහතා පෙටූනියා රාජ්‍ය විශ්වවිද්‍යාලයේ ආචාර්යවරයෙකු වන අතර පෙටූනියා රාජ්‍යයේ විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ගේ වෘත්තීය සංගමයේ (PAUT) සභාපතිවරයාද වේ. PAUT සහ තවත් වෘත්තීය සමිති කිහිපයක් මෑතක දී රජය විසින් පනවන ලද ආදායම් බදු වැඩි අගයකින් ඉහළ නැංවීමේ රෙගුලාසිවලට විරුද්ධත්වය ප්‍රකාශ කිරීම සඳහා එක් නගරයක සිට පෙටූනියා අගනුවර දක්වා විරෝධතා පා ගමනක් පැවැත්වීමට තීරණය කළේය. ඒ අනුව ඔවුන් දින දෙකක් පෙළපාලියෙන් පැමිණ පසුව පෙටූනියා අගනුවර මධ්‍යම වෙළඳ නගරයේ (CBD) විශාල භූමියකට රැස් වී සාමකාමී විරෝධතාවක් පැවැත්වීමට අදහස් කළහ. විරෝධතා පාගමන ආරම්භ වීමට දිනකට

started attacking the protestors. The police arrested a few protestors alleging that they have acted in an unruly manner and on the basis that some have used abusive and foul language against the president of Petunia. Mr. Jayan was also among those who were arrested during the protest. According to the newspaper reports, supporters of the ruling political party have assisted the police in carrying out those arrests.

Upekha and Sujeen, young doctors who work in the Central Hospital of Petunia were also arrested by the police when they were on their way back home from the protest. Later they ware interdicted from their profession mentioning that they contributed in organizing conspiracies against the state of Petunia.

On behalf of Jayan, Upekha, Sujeen and all others who were arrested and discriminated, the PAUT intends to file a fundamental rights petition in the Supreme Court of Petunia.

The PAUT seeks your advice on whether it can file a fundamental rights petition. Advise PAUT assuming that the Constitution of Petunia is similar to that of Sri Lanka.

**(20 marks)**

Answer **question 7(a)** OR **question 7(b) only.**

**7(a).** "Constitutional amendments in the recent past in Sri Lanka have addressed the need for a substantial reduction of the President's executive power and ensuring the independent councils and commissions to democratize and depoliticize governance."

Do you agree with the above statement?

Justify your answer taking examples from 18th to 21st Amendments to the 1978 Constitution of Sri Lanka.

**(20 marks)**

**OR**

**7(b).** Write an analytical report on the contribution of the provisions relating to referendum in the Second Republican Constitution in promoting democracy in Sri Lanka.

**(20 marks)**

**8.** Article 3 of the 1978 Constitution states that:

'In the Republic of Sri Lanka sovereignty is in the People and is inalienable. Sovereignty includes the powers of government, fundamental rights and the franchise.'

පෙර CBD හි නගර සභාව විසින් ජයන් මහතා ඇතුළු විරෝධතා සංවිධායකයින්ට දන්වා සිටියේ එම කවුන්සිලයේ විධායක මණ්ඩලය විසින් විරෝධතාකරුවන්ට ඉහත කී පිටියට රැස් වීමට පෙර ලබා දී තිබූ අවසරය ආරක්ෂක හේතු මත අවලංගු කර ඇති බවයි. කෙසේ වෙතත්, එම භූමියම පසුව පක්ෂ ප්‍රචාරක රැස්වීමක් පැවැත්වීමට පෙටූනියාවේ වත්මන් ආණ්ඩු පක්ෂය වෙත ලබා දී ඇති බව ජයන් මහතාට දැනගන්නට ලැබිණි.

කෙසේ වෙතත්, එම පාගමන වෙනත් ස්ථානයක සිට අගනුවර දක්වා ගමන් කළ අතර පෙටූනියා අගනුවර ජනාධිපති ලේකම් කාර්යාලය ඉදිරිපිට සටන් පාඨ සහිත පුවරු අතැතිව සාමකාමී විරෝධතාවයක් ආරම්භ කරන ලදී. නමුත් පෙටූනියා හි සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද දැනට පවතින COVID-19 සෞඛ්‍ය මාර්ගෝපදේශය උල්ලංඝනය කරන බව පවසමින් විරෝධතාව නතර කරන ලෙස පොලීසිය විරෝධතාකරුවන්ට නියෝග කළේය. කෙසේ වෙතත්, එය නොතකමින් විරෝධතාව අඛණ්ඩව පැවති අතර, පසුව විරෝධතාකරුවන්ට පොලීසිය පහර දීමට පටන් ගැනීමත් සමඟ එය ප්‍රචණ්ඩකාරී විය. නොසන්සුන් හා ප්‍රචණ්ඩකාරී ලෙස ක්‍රියා කළ බවට සහ ඇතැමුන් පෙටූනියා ජනාධිපතිවරයාට විරුද්ධව අපහාසාත්මක හා අසභ්‍ය වචන භාවිතා කළ බවට චෝදනා කරමින් විරෝධතාකරුවන් කිහිප දෙනෙකු පොලිසිය විසින් අත්අඩංගුවට ගනු ලැබීය. එලෙස විරෝධතාවයේදී අත්අඩංගුවට ගත් පිරිස අතර ජයන් මහතා ද විය. එම පුවත්පත් වාර්තා වලට අනුව එම අත්අඩංගුවට ගැනීම් සිදුකිරීමට පාලක දේශපාලන පක්ෂයේ ආධාරකරුවන් පොලීසියට සහය වී තිබෙයි.

පෙටූනියා ජාතික රෝහලේ සේවය කරන තරුණ වෛද්‍යවරුන් දෙපළක් වන උපේඛා සහ සුජීන් ද එම විරෝධතාවයෙන් පසු නිවස බලා යමින් සිටියදී පොලීසිය විසින් අත්අඩංගුවට ගන්නා ලදී. පසුව ඔවුන් පෙටූනියා රාජ්‍යයට එරෙහිව කුමන්ත්‍රණ සංවිධානය කිරීමට දායක වූ බව සඳහන් කරමින් ඔවුන්ගේ වෘත්තියෙන් සේවා තහනමකට ලක්කරන ලදී.

ජයන්, උපේඛා, සුජීන් සහ අත්අඩංගුවට ගත් සහ වෙනස් කොට සැලකීමට ලක් වූ සියලු දෙනා වෙනුවෙන්, පෙටූනියා ශ්‍රේෂ්ඨාධිකරණයේ මූලික අයිතිවාසිකම් පෙත්සමක් ගොනු කිරීමට PAUT අදහස් කරයි.

PAUT විසින් මූලික අයිතිවාසිකම් පෙත්සමක් ගොනු කළ හැකිද යන්න පිළිබඳව ඔබේ උපදෙස් පතයි. පෙටූනියා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සමාන යැයි උපකල්පනය කරමින් PAUT ට උපදෙස් දෙන්න.

**(ලකුණු 20)**

However, as of today, it is questionable whether that sovereign power really belongs to the people or the three main institutions of the government and the office bearers of those institutions. This situation has been one of the considerations highlighted at the people's demands for new constitutional order in the recent controversial incidents happened in Sri Lanka.

Critically evaluate the above statement by citing relevant Articles of the 1978 Constitution of Sri Lanka and case law.

**(20 marks)**

---Copyrights reserved---

7(අ) ප්‍රශ්නයට හෝ 7(ආ) ප්‍රශ්නයට පමණක් පිළිතුරු සපයන්න.

**7(a).** "පසුගිය කාලය තුළ ශ්‍රී ලංකාවේ සිදු වූ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන මගින් ජනාධිපතිවරයා සතු විධායක බලතල සැලකිය යුතු ලෙස සීමා කිරීමේ අවශ්‍යතාවය ආමන්ත්‍රණය කර ඇති අතර පාලනය ප්‍රජාතන්ත්‍රීකරණය කිරීමට සහ දේශපාලනීකරණයෙන් තොර කිරීමට ස්වාධීන සභා සහ කොමිෂන් සභා ස්ථාපිත කර තිබේ."

ඉහත ප්‍රකාශය සමඟ ඔබ එකඟ වන්නේද?

1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 18 වැනි සංශෝධනයේ සිට 21 වැනි සංශෝධනය දක්වා වන සංශෝධන වලින් ගත් උදාහරණ දක්වමින් ඔබේ පිළිතුර සාධාරණීකරණය කරන්න.

**(ලකුණු 20)**

හෝ

**7(b).** ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදය ප්‍රවර්ධනය කිරීමෙහිලා දෙවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අන්තර්ගත ජනමත විචාරණයට අදාළ විධිවිධාන මගින් සපයන දායකත්වය පිළිබඳව විශ්ලේෂණාත්මක වාර්තාවක් ලියන්න.

**(ලකුණු 20)**

**8.** 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 3 වන වගන්තිය මෙසේ දක්වයි:

"ශ්‍රී ලංකා ජනරජයේ පරමාධිපත්‍යය ජනතාව කෙරෙහි පිහිටා ඇත්තේය. පරමාධිපත්‍යය අත්හළ නොහැක්කේය. පරමාධිපත්‍යයට පාලන බලතල, මූලික අයිතිවාසිකම් සහ ඡන්ද බලයද ඇතුළත් වන්නේය."

කෙසේ නමුත්, අද වන විට එම පරමාධිපත්‍ය බලය සත්‍යය වශයෙන්ම ජනතාව සතුවන්නේද එසේ නැතහොත් ආණ්ඩුවේ ප්‍රධාන ආයතන ත්‍රිත්වය සහ එම ආයතනවල නිලතල දරන්නන් සතුවන්නේද යන්න ප්‍රශ්නාර්ථයකි. මෙම තත්ත්වය ශ්‍රී ලංකාවේ මෑතකාලීනව සිදු වූ ආන්දෝලනාත්මක සිදුවීම් වලදී නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සම්බන්ධයෙන් වන ජනතා ඉල්ලීම්වලදී ඉස්මතු වූ එක් කරුණක් විය.

1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අදාළ වගන්ති සහ නඩු තීන්දු නීතිය උපුටා දක්වමින් ඉහත ප්‍රකාශය විවේචනාත්මකව ඇගයීමට ලක් කරන්න.

**(ලකුණු 20)**

--- හිමිකම් ඇවිරිණි --